# වකුගඩු රෝගය ව්‍යාප්තියට එරෙහිව සංවිධානාත්මක ව්‍යාපෘතියක් ගොඩනැගීමට රජය අපොහොසත් වීම

එස්. එම්. එස්. ඩී. කුමාරතුංග - දේශපාලනවිද්‍යා හා රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශය

විවිධ රජය යටතේ සෞඛ්‍ය ගැටලු සඳහා කලින් කලට සාර්ථක විසඳුම් ලබා දීමට හැකි වුවත් වකුගඩු රෝගය සම්බන්ධයෙන් නිශ්චිත විසඳුමක් ලබා දීමට අපොහොසත් වී ඇත. මෙය, මෙම අධ්‍යයනයේ මූලිකව විමර්ශනය කෙරෙන කරුණයි. එම නිසා මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වන්නේ බලයට පත් වන රජයන් විසින් වකුගඩු රෝග සෞඛ්‍ය තත්වය මර්දනය උදෙසා සම්පාදිත රාජ්‍ය ප්‍රතිපත්ති මගින් එම රෝගය නිවාරණය කිරීමට නොහැකි වූයේ මන්ද යන්නයි. මෙම අධ්‍යයනය සඳහා රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ විශ්ලේෂණයක් සිදූ කරනු ලැබූ අතර එහි භාවිතය හා ඵලදායිතාව තේරුම් ගැනීමට රාජ්‍ය නිලධාරීන්, සාමාන්‍ය ජනතාව සහ රෝගීන් සමඟ වාස්තවික හා මනෝමූලික ක්‍රමවේද භාවිත කරන ලදි. මේ සඳහා අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ රෝගීන් හතළිස්දෙනෙකු සමඟ ව්‍යූහගත ප්‍රශ්නාවලියකින් ද, වෛද්‍යවරුන්, හෙදියන් හා නිලධාරීන් සමඟ සාකච්ඡා ක්‍රමයකින් ද අධ්‍යයනය සිදු කරන ලදි. මෙකී රෝගය කෙරෙහි බලපාන හේතු අධ්‍යයනයේ දී අනාවරණය වූයේ ප්‍රදේශයේ වකුගඩු රෝගය වැළඳීමේ අවදානම් සහිත පුද්ගලයන්ගේ රෝගීභාව අවම ප්‍රතිශතයක් කරා යොමු කිරීමට ප්‍රතිපත්ති ප්‍රායෝගිකව අසමත් වී ඇති බවයි. එයට හේතුව පුරවැසියන්ගේ අඩු ආදායම නිසා රාජ්‍ය ප්‍රතිපත්තිවල ඵලදායීත්වය භුක්ති විඳීමට නොහැකි වීමයි. එවැනි ප්‍රතිපත්ති කෙතරම් න්‍යායාත්මකව යෝග්‍ය වුවත් ප්‍රායෝගිකව වර්තමාන ආර්ථිකයෙහි ක්‍රියාත්මක නොවේ. සමහර ජීවන චර්යාව හා වෘත්තීය චර්යා ආරක්ෂණ ක්‍රම නොපිළිපැදීම මෙන්ම ඇතැම් වෛද්‍ය අවවාද භාවිත නොකිරීම දක්නට ලැබුණි. ඇතැමුන් වකුගඩු රෝගයට පිළියම් ලෙස ගෙන ආ රාජ්‍ය ප්‍රතිපත්ති හා විසඳුම් රෝගය සුව කිරීමට බලපාන සාධක නොවෙයි. මෙම පර්යේෂණයේ දී අනාවරණය වූ මූලික කාරණය වන්නේ වර්තමාන නව ලිබරල්වාදී වෙළඳපොළ ආර්ථික ගතිකත්වය අභිමුඛ කෘෂිකාර්මික ගොවි ජනතාව මුහුණ දෙන ප්‍රධාන සෞඛ්‍ය අභියෝගය වූ වකුගඩු රෝගය සඳහා රජය සහ නිලධාරි පැලැන්තිය තුළ මෙන්ම ගොවි ප්‍රජාව අතරත් සංවිධානාත්මක මෙන්ම නිශ්චිතව එම රෝගය මැඩපැවැත්වීමට අවැසි ව්‍යාපෘතියක් බිහි කිරීමට අපොහොසත් වී ඇති බවයි.

***ප්‍රමුඛ පද:*** *වකුගඩු රෝගය, දේශපාලන ආර්ථිකය, රාජ්‍ය ප්‍රතිපත්ති, කෘෂිකර්මාන්තය*